*සැ. යු.* - 2021.09.017 වැනි දින පළ කරන ලද අංක 2246 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,247 - 2021 සැප්තැම්බර් මස 24 වැනි සිකුරාදා - 2021.09.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 182 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 184 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ඔක්තොබර් මස 15 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ඔක්තෝබර් මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, චතුරංග ගුණසේකර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.08.18 දින ප්‍රදනය කර ඇති අංක 2/ගා/15/ප්‍ර/ 20475 - එල්. එල්. 49221 දරන ප්‍රදන පත්‍රයේ හිමිකරු වන මාවිට පදිංචි සීලවත්ත සිටුගේ බේබිනෝනා වෙත ප්‍රදානය කොට ගාල්ල ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/G 14/77 යටතේ 1995.11.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.10.15 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ හිනිදුම් පත්තුව උතුර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාසයේ හිනිදුම් පත්තුව උතුර පත්තුවේ/කෝරළයේ මාවිට නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාවිට ගම නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 13 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. පි. 470 දරන පිඹුරෙහි අංක 556 1/2 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.202 ඇතැයි ගණන් බලා තිබෙන මානගෙදර හේන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම පිඹුරෙහි කැබලි අංක 559 (ප්‍රවේශ මාර්ගය) |
| *නැගෙනහිරට* | : | මෙම පිඹුරෙහි කැබලි අංක 567, 559 (ප්‍රවේශ මාර්ගය), |
| *දකුණට* | : | මෙම පිඹුරෙහි කැබලි අංක 567, 554, 555, |
| *බස්නාහිරට* | : | මෙම පිඹුරෙහි කැබලි අංක 554, 556 2/2. |

චතුරංග ගුණසේකර,
ප්‍රාදේශීය ලේකම්,
නෙළුව.

2020 දෙසැම්බර් මස 16 වැනි දින.

09-174/1

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, ගල්ලල ගමාච්චිගේ ලක්ෂ්මි කාන්ති වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.02.18 දින ප්‍රදනය කර ඇති අංක ගා/ප්‍ර 8023 (එල්. එල්. 34766) දරන ප්‍රදන පත්‍රයේ හිමිකරු වන දලවැල්ල හේවගේ ඇලිස් වෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. ඩී 4/152 යටතේ 1986.07.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.10.15 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තල්පෙ පත්තුවේ හව්පෙ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හව්පෙ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ............... භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක .......... දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි ................ විසින් සම්පාදිත අංක අ. ග. සි. 651 දරන කට්ටි කැඩීමේ පිඹුරේ .......... විසින් සම්පාදිත අංක ......... දරන රේඛා සටහනේ අංක 469 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 01, පර්චස් 06ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද වැරණියගොඩකන්ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ කැබලි අංක 471, |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ කැබලි අංක 470, |
| *දකුණට* | : | මෙම ඉඩමේ කැබලි අංක 113, |
| *බස්නාහිරට* | : | මෙම ඉඩමේ කැබලි අංක 468. |

ජී. පී. ලක්ෂ්මි කාන්ති,
ප්‍රාදේශීය ලේකම්,
ඉමදූව.

2020 දෙසැම්බර් මස 09 වැනි දින.

09-174/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, චතුරංග ගුණසේකර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.03.10 දින ප්‍රදානය කර ඇති අංක ගා/ප්‍ර10073 - LL 44086 - දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කොස්වත්ත පදිංචි මාදුගැට ජයරත්න හේවගේ තෙපානිස් වෙත ප්‍රදානය කොට ගාල්ල ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO G 04/87 යටතේ 1987.10.27 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.10.15 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිනිදුම් පත්තුව උතුර පත්තුවේ/කෝරළේ මාවිට ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොස්වත්ත නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 473 දරන පිඹුරේ අංක 203 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.406 ක විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම නාකන්දහේන.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 189 හා 190, |
| *නැගෙනහිරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 202 හා 204, |
| *දකුණට* | : | මෙම පිඹුරේ කැබලි අංක 188 හා 204, |
| *බස්නාහිරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 188 හා 189. |

චතුරංග ගුණසේකර,
ප්‍රාදේශීය ලේකම්,
නෙළුව.

2020 ජනවාරි මස 21 වැනි දින.

09-174/3

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, සීනා කෝරලයලාගේ විමල් සිසිර කුමාර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.05.19 දින ප්‍රදානය කර ඇති අංක ගාප්‍ර/10380 හා එල්. එල්. 64122 - දරන ප්‍රදාන පත්‍රයේ හිමිකාරිය වන ගණේගොඩ පදිංචි කහිප්පුලිගේ අගිස්තිනා වෙත ප්‍රදානය කොට බලපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 88 යටතේ 1988.02.12 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.10.15 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට නැගෙනහිර ප්‍රාදේශීය ආදායම් නිළධාරී කොට්ඨාසයේ බෙන්තර වලල්ලාවිට නැගෙනහිර පත්තුවේ/කෝරළයේ ඇල්පිටිය උතුර ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයේ ගනේගොඩ නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක ...... දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු. පි. ගා. 2074 දරන පිඹුරෙහි අංක 26 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.092 ක් ඇතැයි ගණන් බලා තිබෙන කැටපලවත්ත යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 25, |
| *නැගෙනහිරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 22, |
| *දකුණට* | : | මෙම පිඹුරේ කැබලි අංක 27, |
| *බස්නාහිරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 65. |

එස්. කේ. ඩබ්. සිසිර කුමාර,
ප්‍රාදේශීය ලේකම්,
ඇල්පිටිය.

2019 ජුනි මස 17 වැනි දින.

09-174/4

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, ඩී. ධම්මික එස්. වීරකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.04.19 දින ප්‍රදානය කර ඇති අංක ගා/ප්‍ර 939 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන හල්විටිගල පදිංචි සායක්කාර හේවා රදාගේ ඔමානියල් වෙත ප්‍රදානය කොට ගාල්ල ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 405 හා ජී 1/52 යටතේ 1982.07.26 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැතිවීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.10.15 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිනිදුම් පත්තුව දකුණ හල්විටිගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හල්විටිගල නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 05 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. සි. 485 දරන පිඹුරෙහි අංක 438 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් දෙකයි (02), පර්චස් විස්සයි (20) ක් ඇතැයි ගණන් බලා තිබෙන මාවතගොඩ යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

*උතුරට* : මෙම සැලැස්මේ කැබලි අංක 437, 439 හා 441,
*නැගෙනහිරට* : මෙම සැලැස්මේ කැබලි අංක 441,
*දකුණට* : මෙම සැලැස්මේ කැබලි අංක 459,
*බස්නාහිරට* : මෙම සැලැස්මේ කැබලි අංක 437 හා 459.

ඩී. ධම්මික එස්. වීරකෝන් ,
ප්‍රාදේශීය ලේකම්,
තවලම.

2021 අගෝස්තු මස 22 වැනි දින.

09-174/5

---

## ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/57995.
ඉඩම් කොමසාරිස්ගේ අංකය : LCD/16/LND/07/02/03/03/F1/80.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 88, යහංගල නැගෙහිර ග්‍රාම නිලධාරි වසමේ වක්කාරිය ගමේ H/HMB/2007/73 දරන අනුරේඛන කැබලි අංක A දරන ප්‍රමාණයෙන් හෙක්. 0.3227ක් වන රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා සී/ස හම්බන්තොට විවිධ සේවා සමුපකාර සමිතිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

*උතුරට* : අ. භූ. පි. 03 හි කැබලි අංක A 826,
*නැගෙනහිරට* : මාර්ග රක්ෂිතය,
*දකුණට* : අ. භූ. පි. 03 හි කැබලි අංක A 826,
*බටහිරට* : මාර්ග රක්ෂිතය.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2020.07.08 දින සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල*.- 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට

වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2020.07.08 වැනි දින සිට වසර පහක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළකරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්. එල්. ඒ. සංජීව,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 සැප්තැම්බර් මස 24 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-202

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/54400.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
නිඉකො/හම්/ඉ2/තිස්/ව්‍යා. අන/27.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරින්ද ග්‍රාම නිලධාරි වසමේ කිරින්ද ගමේ අනුරේඛන අංක LC/TSS/2009/217 හි කැබලි අංක B දරන ප්‍රමාණයෙන් හෙක්. 0.6310ක් වන රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ප්‍රජන්ත රත්වත්ත මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එච්. එම්. ජයතුංග පදිංචි ඉඩම, |
| *නැගෙනහිරට* | : | කලපුව රක්ෂිතය හා රජයේ ඉඩම, |
| *දකුණට* | : | මුඩු ඉඩම, |
| *බටහිරට* | : | යාල පාර. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2021.07.14 දින සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2021 ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 50%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2020.07.14 දින සිට වසර පහක් ගතවන තුරු මෙම ඉඩම් බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

අවංකා මුදලිගේ වීරසිංහ,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2021 සැප්තැම්බර් මස 24 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-201

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/63849.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : PC/LC/LD/4/1/32/1092.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රුවන්එළිය ග්‍රාම නිලධාරි වසමේ බිලැක්පූල් ගමෙහි පිහිටි අංක මු. පි. නු. 3270 පිඹුරෙහි කැබලි අංක 01 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2110ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් අපස්වාමිදුගේ පාසලෙහි ද්විතීක අංශය ස්ථාපිත කිරීම සඳහා මධ්‍යම පළාත් රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 02, |
| *නැගෙනහිරට* | : | මු. පි. 7217 හි කැ. අ. 50 බී මු. පි. ඒ. 2283 හි කැ. අ. 1, 2, 5, |
| *දකුණට* | : | මු. පි. ඒ. 1178 හි කැබලි අංක 43 සහ මෙම පිඹුරේ කැ. අ. 2, |
| *බටහිරට* | : | කැබලි අංක 02. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය*.- අවුරුදු තිහයි (30) (ගරු ඇමතිතුමා බදු අනුමත කල 2021.07.26 - 2051.07.25 දක්වා)

*වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2021 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*වාර මුදල*. - වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම අධ්‍යාපනික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2021.07.26 දින සිට වසර 05ක් ගතවන තුරු අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ කවූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

සමීර පී. හෙට්ටිආරච්චි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2021 සැප්තැම්බර් මස 17 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-203

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.